# ඉස්කෝලෙන් ටියුෂන්



## පමණ නොවී එම් අකුරට

රසික සූරියආරච්චි ලියයි

මා කුඩා කාලයේ දී පුද්ගලික උපකාරක පන්ති හෙවත් අප කවුරුත් දන්නා පරිදි ටියුෂන් පන්ති පසු කලෙක තරම් සංවිධානාත්මකව පැවැත්වුනේ නැත. ගම්බදව නම් මේ ගැන හාංකවිසියක්වත් නොතිබුණි. මා පස්වැන්නේ දී ජනප්‍රිය පාසල් තරගයට පෙනී සිටියේ ද, හත්වැන්නේ දී ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටියේ ද උපකාරක පන්ති තබා උපකාරක පොත්වලවත් සහය නොමැතිව ය.

කුඩා උප නගර අවට සමහර තැන්වල ඉංගිරිසි සහ ගණිත උපකාරක පන්ති පැවැත්වුණු අතර, ඒවාට වුවද බොහෝ දුරට සහභාගී වූයේ පාසලේ ඉගැනුමෙන් විෂයය කරුණු අවබෝධ කර ගත් නොහැකි වූ, -වැඩබැරිදස" ලා ය. ඒ ද ඔවුන් ගේ දෙමව්පියන්ට මුදල් වියදම්කර දරුවන්ට උගන්වන්නට වත්කම තිබුණෝ නම් පමණි.
මා සාමාන්‍ය පෙළ විභාගයට සූදනම් වෙන සමයේ දී නම් අද රුපියල් බිලියන ගණනක ව්‍යාපාරයක් වන ටියුෂන් ව්‍යාපාරයේ අංකුර පැන නගින්නට පටන් ගෙන තිබුණි. ඒ නොමිලේ පැවැත්වෙන අධ්‍යාපන සම්මන්ත්‍රණ විලාසයෙනි. දවසක් පුරාම පාහේ විවිධ විෂයයන් ඉලක්ක කොට ගෙන පැවැත්වුණු මේ සම්මන්ත්‍රණ අවසානයේ ඒ ඒ ගුරුවරුන් ගේ ටියුෂන් පන්තිවලට සිසුන් බැඳෙන්නට ඇති යැයි සිතමි.

තවත් අවුරුද්දක් දෙකක් ඇතුළත, මා උසස් පෙළ හැදෑරීම ඇරඹූ සමය වන විට ටියුෂන් පන්ති යනු කෙමෙන් කෙමෙන් අධ්‍යාපනයේ සාමාන්‍ය අංගයක් බවට පත්වෙමින් තිබුණි.

අද ලංකාවේ පාසල් ළමෝ අති මහත් බහුතරය උදේ පාසල් ගොස් සවස ටියුෂන් පන්ති යන්නේ -බත් කා වතුර බොනවා" මෙනි. කොටින්ම මේ ටියුෂන් පන්ති ඇරඹෙන්නේ පහේ පන්තියේ ශිෂ්‍යත්ව විභාගයට ද හත් ගව්වක් තියා දෙවෙනි ශ්‍රේණියේ සිටම වාගේ ය. සාමාන්‍ය පෙළ විභාගය අවසන් වී ඒ ප්‍රතිඵල මත පාසල්වල උසස් පෙළ පන්ති ඇරඹීමට ගතවන හය මසක පමණ කාලය තුළ, උසස් පෙළ සමස්ත විෂයය නිර්දේශයම උගන්වා අවසාන කෙරෙන පන්ති ද අද ලංකාවේ ඇත.

අද තත්වය එසේ වුවද, මා කලින් සඳහන් කළ පරිදි ටියුෂන් ප්‍රවනතාවය අංකුරයේ සිට දළු ලා වැඩෙන්නට පටන් ගත් අපේ කාලයේ නම්, උසස් පෙළ අරඹා වසරක් පමණ ගතවෙන තුරුම වාගේ අප බොහෝ දෙනෙකු පුද්ගලික උපකාරක පන්ති වල පිහිට ලබා ගැනීමට නොසිතූහ. ඒ සේරටමත් වඩා, තම පාසලේ ළමුන් එලෙස පුද්ගලික



පන්තිවලට සහභාගී වීම පාසලට කෙරෙන අපහ-ාසයක් ලෙසද සමහර පාසල් පරිපාලකයෝ කල්පනා කළහ. ඇතැම් බාලිකා පාසල්වල සිසුවියන්ට පාසල් නිල ඇඳුමෙන් සැරසී සවස් කාලයේ පැවැත්වෙන මේ අමතර පන්ති වලට සහභාගී වීමේ තහනමක් ද පැණවී තිබුණි.
මේ වාතාවරණය තුල, ආනන්ද විද්‍යාලයේ ම ගුරුවරුන් විසින් උගන්වනු ලබන ටියුෂන් පන්ති පාසල් වේලාවෙන් පසු පාසල තුළදී පැවැත්වීමට පාසලේ පාලකයින් විසින් ම කටයුතු යෙදීම පුදුමයට කරුණක් නොවීය. එය සමහර විට ඇරඹන්නට ඇත්තේ, පාසල් මූලික අධ්‍යාපනය, එය කෙමෙන් කෙමෙන් ගිල ගැනීමට සැරසෙන ටියුෂන් පන්ති මාරයාගෙන් බේරා ගැනීම වැනි හොඳ චේතනාවකින් යුතුව යයි මම සිතමි.

විභාගවලට ළමුන් සූදානම් කිරීම අරබයා පාසල් ගුරුවරුන් විසින් ස්වේච්ඡාවෙන් පවත්වනු ලබන අමතර පන්ති ගැන අප අසා ඇත. ආනන්දයේ ඇරඹුණු ටියුෂන් පන්තිද ඉහත ආකාරයේම ඒවා විය. එකම වෙනසකට තිබුනේ, ඒ සඳහා මුදල් ගෙවිය යුතු වීම පමණි.

සමහරවිට හැම උසස් පෙළ විෂයයක් සඳහාම එදා මෙසේ පන්ති සංවිධානය නො-වන්නට ඇත. තිස් එක් වසරකට පසු අද මගේ මතකයේ ඇත්තේ මා සහභාගී වූ භෞතික විද්‍යා අමතර පන්තිය ගැන පමණි. ඒ පන්තියේ ඉගැන්වීම භාර වී තිබුනේ ආනන්දයේ එවකට සිටි ගුරුවරයෙක් වූ ප්‍රබුද්ධ කරුණාරත්න ට ය.
ප්‍රබුද්ධ කරුණාරත්න එකල අපේ පාසලේ සිටි ජනප්‍රිය තරුණ ගුරුවරයෙකි. ඉගැන්වීමේ දී ඔහු කෙරෙන් පළවූයේ ස්වකීය නමටම සරිලන ආක-ාරයේ විදග්ධ භාවයකි. එසේ හෙයින් ප්‍රබුද්ධ කරුණාරත්න ගේ භෞතික විද්‍යා ටියුෂන් පන්තියට බොහෝ සිසුහු බැඳුණහ. එයට තවත් හේතුවක් වූයේ සතියකට එක් සවස් වරුවක පැය තුනක් පැවති මේ ටියුෂන් පන්තියේ අයකිරීම වූයේ මසකට රුපියල් පහක් පමණක් වීමයි.
මේ මුදල් අප ගෙවිය යුතු වූයේ පාසලේ පහසුකම් ගාස්තු එකතු කිරීම බාරව සිටි ගුරුවරියට වූ අතර, ඒ සඳහා නිසි පරිදි රිසිට් පතක් ද ලැබුණි. මුදල් පාසල් අරමුදලට බැර වුණු බව පෙණුනි. අමතර ඉගැන්වීම සඳහා ප්‍රබුද්ධ කරුණාරත්න ට මුදල් ගෙවන්නට ඇත්තේ ඒ අරමුදලෙනි.

අවුරුදු හතලිහක් පමණ රජයේ ගුරුවරයෙකු ලෙස කළ සේවයෙන් පසු මගේ පියා වසර 1978 නොවැම්බරයේ දී විශ්‍රාම ගොස් සිටියේය. එදින සිට විශ්‍රාම වැටුප ලෙස යම් මාසික ආදයමක් ලැබෙන තුරු ගතවූ මාස කිහිපයක කාලයේ අපේ පවුලේ ආර්ථිකය එතරම් යහපත් තත්වයක නොතිබුණු බව අමුතුවෙන් කිව යුතු නොවේ. මේ දිනවල අප ජීවත්වූයේ තාත්තාට ලැබුණු යම් මුදලක් බැංකුවේ තැන්පත් කර ලැබුණු සුළු පොලියෙන් බව මගේ මතකයයි.
අනුන් ගේ නිවසක නොමිලේ ජීවත්වීම සහ වත්තේ පොල්, දර සහ අම්මා ගේ බතල, මයියොක්කා පාත්ති නිසා ජීවන වියදම සීමා සහිත විය. පාසලේ ටියුෂන් පන්තියට රුපියක් පහක් සොයා ගැනීම ප්‍රශ්නයක් නොවුන ද, මේ අතරතුර මම අනෙක් විෂයයන් තුන සඳහා සෙනසුරාද දිනයන් හි ගම්පහ නගරයේ පැවැත්වුණු පන්තියට යාම අරඹා තිබුණු නිසා ඒ සඳහා මාසිකව තවත් රුපියල් පහලොවක මුදලක් ද සොයා ගැනීමට සිදුවී තිබුණි.
පවුලේ මුදල් අර්බුදය හමුවේ එක් මාසයක දී මට සිදුවුනේ පෞද්ගලික ටියුෂන් පන්තියට මුදල් ගෙවා, පාසලේ ටියුෂන් පන්තියට මුදල් ගෙවීම කල් දැමීමටයි.

එසේ වුවද, මා දිගටම පාසලේ ටියුෂන් පන්තියට සහභාගී වූ අතර එහි වරදක් මට නොපෙනුණි. අපේ ම ඉස්කෝලේ නොවැ! අපේ ම භෞතික විද්‍යා ගුරුවරයා නොවැ!

දින කිහිපයකින් පසුව පැවති ඊලඟ සතියේ පාසල් ටියුෂන් පන්තියේ දී ගුරුවරයා එහි සිටි සියයක් පමණ අපට අපේ නම් එහි ලියන ලෙස පවසා කොල කිහිපයක් පේලියෙන් පේලියට යැවූ විට ද, අවශ්‍ය නම් එසේ නොකර සිටීමට ඉඩ තිබුණ මුත් මා මගේ නම පැහැදිළිවම සඳහන් කලේ මා වරදක් කර නොමැති නිසා ය. පන්තියේ සියයක් සිටියද, ගාස්තු ගෙවූ ලයිස්තුවේ සිටින්නේ හතලිහක් පමණක් බවද ඒ ලයිස්තුව පන්තියේ අතිනත යවමින් ප්‍රබුද්ධ කරුණාරත්න අප සමග පැවසුවේය.
ඊලඟ සතියේ අපේ අංශ ප්‍රධානියා අපේ පන්තිය පැමිණියේය. පන්තියේ කෙරෙමින් තිබූ පාඩම නවත්වා පන්තිය ඉදිරියට ගිය ඔහු සිසුන් පිරිසක ගේ නම් කියවා ඔවුනට නැගිටින සේ පැවසූ අතර මගේ නම ද ඒ ලයිස්තුවේ කියවුණු නිසා මම ද නැගිට සිටියෙමි.

-මේ ළමයි පාසලෙන් පැවැත්වෙන අමතර පන්තිවලට මුදල් නොගෙවා සහභාගී වී තියෙනවා. එය වරදක්, වංචාවක්. මෙහෙම ගියොත් අපිට මේ හොඳ වැඩේ නවත්වා දන්න වෙනවා. මේ සියළු දෙනාම තමන් ගැන ලැජ්ජා විය යුතුයි" ඔහු කීවේය.
ඔහු කීවද නොකීවද මට ඇතිවූයේ පොලොව පලාගෙන යන තරමේ ලජ්ජාවකි. මා වංචාවක්, වරදක් කළා යැයි ඇත්තටම මම නොදැන සිටියෙමි. ඒ වන විට මා සහභාගී වෙමින් තිබූ පෞද්ගලික ටියුෂන් පන්තියේ නම්, සිසුන් ගේ නම් ලයිස්තුවක් තිබුණි. අප සියළු දෙනාම මුදල් ගෙවුයේ මාසයේ මුල එක ම දවසේ නොවේ. මුදල් ගෙවූ විට එය නම් ලයිස්තුවේ සටහන් කෙරේ.

මා පසුව සහභාගී වූ පන්තිවල මුදල් ගෙවා කාඩ් පතක් ගත යුතුය. පන්තියට ඇතුළුවන විට එහි සලකුණක් තැබේ. මේ හැම පන්තියකම විවිධ හේතු මත යම් දිනයක අතේ මුදල් නොමැති අයට පසුව මුදල් ගෙවීමට ක්‍රම සකසා තිබුණි.
අපේ පාසල් ටියුෂන් පන්තිය අරඹා එය පරිපාලනය කළ අය මෙලෙස විවිධාකාර වූ සිදුවිය හැකි දේ සළකා ඒ එක් එක් අවස්ථාව සඳහා විකල්ප සකසා නොතිබුණි. කොටින්ම ඒ සල්ලි ඊලඟ මාසේ ගෙවනවා ය කියා කියන්නැයි අම්මා මට කියා තිබුණද, එසේ කීමට ක්‍රමයක් පාසලේ සැකසී නොතිබුණි.

මා වඩාත් ලජ්ජාවට පත්වූයේ මා පාසලේ ටියුෂන් පන්තියට මුදල් ගෙවීම කල් දැම්මේ ඇත්තටම මුදල් අගහිඟකමක් නිසා වීමයි. අද අපරදෘෂ්ඨියෙන් බලන කල, දුප්පත්කම ලජ්ජාවට කරුණක් යැයි එදා මා සිතීම වැරදි බව හැඟුණද, වයස දහතක තරුණයෙකු ගේ සිතට එය එදා නොතේරෙන්නට ඇත.
මට හැඩුම් ආවේය.

කොට කළිසමක් ඇඳීම පිළිබඳව පාසලේ ගුරුවරියක ගේ සරදම් බසට ලක් වූ මා මිතුරු සුනෙත් කරුණාප්‍රේම කළාක් සේ වාග්මය ප්‍රකාශයක් අංශය ප්‍රධානියා හා කරන්නට තරම් එඩිතර බවක් මට නොතිබුණි. ඒ වෙනුවට මා කළේ ලඟදී විශ්‍රාම ගත් පියා ගේ විශ්‍රාම වැටුප තවමත් සැකසී නැති නිසා ඇති වී තිබෙන ආර්ථික ප්‍රශ්ණය ගැන ද, මා කළේ මුදල් ගෙවීම පැහැර හැරීමක් නොව, අම්මාගේ ද අදහස අනුව මේ මාසයේ රුපියල් පහ ඊලඟ මාසයේ ගෙවන්නට කල් දැමීමක් පමණක් බවද කියා දිගු ලිපියක් ලියා එය අංශ ප්‍රධානියාට අතින් බාර දීමයි. මගේ ලිපිය කියවූ ඒ වන විට පනස් විය ද පසු කර සිටි අංශ ප්‍රධානියා මා හා ඉන් පසු කතා කළේ හැඩුම් බර හඬකින් යුතුවය. ඒ තවත් වසරකින් දෙකකින් පමණ තමනට ද විශ්‍රාම යාමට සිදුවෙන බව ද, එවිට තමන් ද මෙවැනි තත්වයකට ලක්වෙන්නට ඉඩ ඇති බව ද සිහි වූ නිසා විය හැකිය.

ප්‍රශ්නයක පසුබිම සොයා නොබලා එක්වරම -නම් කර ලජ්ජාවට පත් කිරීම" හෙවත් -නේමින් ඇන්ඩ් ෂේමින්" ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම යනු එතරම් සීලාචාර දෙයක් නොවන බව අංශ ප්‍රධානියා එදින තේරුම් ගත්තා නම් එය මා ලද ජයග්‍රහණයක් යයි සිතමි. ■


**MATHEMATICS TUTORING**

Maths Methods(CAS) 3&4

Specialist Mathematics

Maths Methods(CAS) 1&2

General Maths Advance

Mathematics Year 7-10

by Madira Ginnige

Experienced Current Secondary School Mathematics Teacher

Attending my small group tuition class will
- Increase confidence, Grades, motivation and self-esteem.
- Gain the ability to manage study time efficiently.
- Ability to manage time efficiently during exam periods.
- Provide opportunity to work through highly relevant, current Trial Sac & Examination questions.

To book/register, contact
03-98071577 or SMS 0432972667
or send an e-mail to:
madiraginige1@yahoo.com

*Individual lessons available on request

Venue: 1/17 Mummery Street, Mount Waverley 3149